# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
# 2026/2027 වර්ෂයන් සඳහා දේශීය සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට 2026/2027 වර්ෂයන් සඳහා පහත සඳහන් භාණ්ඩ වලට අයත් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා රජයේ දෙපාර්තමේන්තු, රජයේ පිළිගත් ව්‍යාපාර ආයතන, රාජ්‍ය සංස්ථා, පිළිගත් සැපයුම්කරුවන් දේශීය නියෝජිතයින් නිෂ්පාදකයින්, වෙළඳ ආයතන වලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සැපයුම්කරුවෙකු ලෙස ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 5000/- ක මුදලක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකුවේ නගර මධ්‍ය(මිඩ් සිටි) ශාඛාවේ අංක 176-1001-990-27357 දරන ගිණුමට 2025/12/22 දින ප.ව. 2.30 පෙර මුදල් තැන්පත් කර බැංකු ස්ලිප් පත/රිසිට් පත අයදුම්පත් සහ අනෙකුත් ඉදිරිපත් කිරීමට ඇති ලිපිලේඛන සමග ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ගෙනවිත් භාර දීමට කටයුතු කරන්න. සියළු විස්තර කොන්දේසි සහ අයදුම්පත් www.railway.gov.lk වෙබ් පිටුවෙන් භාගත කළ හැක.

03. දැනටමත් සැපයුම්කරුවන් වශයෙන් මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී සිටින අයදුම්කරුවන්ද නැවත 2026 / 2027 වර්ෂ සඳහා ද ලියා පදිංචි වීම අනිවාර්ය වේ.

04. සැපයුම්කරු 2025 වර්ෂයට VAT සඳහා සක්‍රීයව ලියාපදිංචි වී ඇති බවට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් සහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතුය. එසේ ඉදිරිපත් නොකරන සැපයුම්කරුවන් VAT සඳහා ලියාපදිංචි වී නොමැති බවට කටයුතු කරනු ඇත.

05. නියමිත දින නියමිත වේලාවට ප්‍රථම ලංසු ලියාපදිංචි තැපැලෙන් හෝ මෙම කාර්යාලයට ගෙනවිත් භාරදිය යුතුය.

06. ලියාපදිංචි වන සැපයුම්කරුවන් අදාල කොන්දේසි අනුව, සැපයිම් කළයුතු අතර, නියමිත ආදර්ශයට හා පිරිවිතරයට අනුව භාණ්ඩ සැපයිය යුතුවේ. එකඟ වී ඇති පරිදි ණයට බඩු සැපයීමට අපොහොසත් වන හෝ පිළිගත හැකි හේතු රහිතව ආදර්ශ ඉදිරිපත් නොකරන හෝ සැපයුම්කරුවන්ගෙන් නැවත මිල දීමනා නොකැඳවීමට කටයුතු කරනු ඇත. ඕනෑම අයදුම් පතක් පිළි ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතුය. භාණ්ඩ හා සේවා සඳහා මිල කැඳවුම් සාමාන්‍යයෙන් ලියා පදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් කරනු ලබන අතර, තරඟකාරී මිලක් ලබා ගැනිමට අවශ්‍ය වූ විට මිල කැඳවීම් වෙනත් සැපයුම්කරුවන්ගෙන් ද ලබා ගැනීමේ අයිතිය දුම්රිය දෙපාර්තමේන්තුව සතුය.

07. ලියාපදිංචි වීමට ඉදිරිපත් කරන අයදුම්පත් වල පහත සඳහන් විස්තර ඇතුලත් විය යුතුය.

1. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත.
2. ව්‍යාපාරික ආයතනයේ නම සහ ස්වභාවය.
3. නිෂ්පාදකයෙක්ද, නැතහොත් ද්‍රව්‍ය බෙදාහරින්නෙක්ද යන වග.
4. ව්‍යාපාරික ලිපිනය , දුරකථන අංකය, ෆැක්ස් අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය
5. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපතක්
6. VAT ලියාපදිංචි සහතිකය (ඇත්නම්)
7. ලියාපදිංචි වන විෂයය භාණ්ඩයයන්

08. සියළුම අයදුම්පත් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2026/2027'' යනුවෙන් සඳහන් කර 2025/12/22 දින හෝ ඊට පෙර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1347, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ගෙනවිත් භාරදිය හැක. ඉහත 07 වන ඡේදයේ දක්වා ඇතිපරිදි නිවැරදි විස්තර නොමැතිව හෝ ලිපි ලේඛණ නොමැතිව හෝ එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(ප්‍රසම්පාදන)

ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
තැ.පෙ.1347, ඕල්කට් මාවත,
කොළඹ 10.
දු. අංකය - 011-2433280